# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,887 - 2014 ඔක්තෝබර් මස 31 වැනි සිකුරාදා - 2014.10.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1896 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1903 |


*සැ. යු.*-2015 මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත 2014 සැප්තැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 නොවැම්බර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 නොවැම්බර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1893- B 80887—2,875 (2014/10)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මොනරාගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 දෙසැම්බර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය (ආ)

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මොණරාගල | මැදගම | මොණරාගල දිස්ත්‍රික්කයේ නන්නපුරාව කොට්ඨාසයේ උප්පැන්න මරණ හා මැදගම කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල. |

10-1118

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 දෙසැම්බර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| අනුරාධපුර | ඉපලෝගම | උතුරු කළාගම් කෝරළේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කළාගම් පළාත කොට්ඨාසයේ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුර | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර |

10-1117

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 දෙසැම්බර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කෑගල්ල | වරකාපොල | ඕතරපත්තුව කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ බෙලිගල් කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට/ සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

10-1115

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු —කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 දෙසැම්බර් මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 15 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | බේරුවල | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ මරදාන ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |

10-1116

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ (රජයේ චිත්‍රපට අංශය) තනතුර සඳහා වන කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ (රජයේ චිත්‍රපට අංශය) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත වන බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. මෙම නිවේදනයේ 'ලේකම්' යන පදයෙන් අදහස් කෙරෙන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ය.

2. *ව්‍යුහගත පරීක්‍ෂණය.*-ව්‍යුහගත පරීක්‍ෂණය පැවැත්වෙන දිනය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය විසින් තීරණය කරනු ඇත.

| *පරීක්‍ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් | 45 |
| අතිරේක පළපුරුද්ද | 30 |
| ක්ෂේත්‍රයේදී දක්වන ලද විශේෂ කුසලතා | 20 |
| සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන ලද කුසලතාව | 05 |
| එකතුව | 100 |

3. *පත් කරනු ලබන අයගේ සංඛ්‍යාව :*
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ (රජයේ චිත්‍රපට අංශය) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත පුරප්පාඩු 01ක් පිරවීමට කටයුතු කරනු ඇත.

4. *පත්වීම ක්‍රියාත්මක වන දිනය ඃ*
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

5. *සේවා කොන්දේසි.*- රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, 2013.06.27 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ (රජයේ චිත්‍රපට අංශය) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නිමයන් හා කොන්දේසිවලට ද, එම බඳවා ගැනීමේ පරිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්‍ෂකයකු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ (රජයේ චිත්‍රපට අංශය) තනතුරට කොන්ත්‍රාත් පදනම මත පත් කරනු ලැබේ.

6. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක රාජකාරි භාරගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

7. *මාසික දීමනාව.*—රුපියල් 30,000 කි.

8. *සුදුසුකම්.*—ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනය වන විට,

(i) *අධ්‍යාපන සුදුසුකම්.*—විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් සපුරා තිබීම.

(ii) *වෘත්තීය සුදුසුකම්.*-ක්ෂේත්‍රයට අදාළව පිළිගත් ආයතනයක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

(iii) *පළපුරුද්ද.*- චිත්‍රපට අධ්‍යක්‍ෂණයට අදාළ කටයුතු පිළිබඳව පිළිගත් ආයතනයක අවම වශයෙන් එක් වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

(iv) *කායික සුදුසුකම්.*—සෑම අපේක්‍ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(v) *වෙනත් ඃ* (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් වන සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

9. *වයස ඃ අවම සීමාව* : අවුරුදු 30
*උපරිම සීමාව* : අවුරුදු 55

10. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය ඃ*

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, ඉල්ලුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත් නිවේදනයේ දැක්වෙන ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත 2014.11.28 වැනි දිනට පෙර ලැබෙන පරිදි එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ (රජයේ චිත්‍රපට අංශය) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත වන බඳවා ගැනීම යන වචන සටහන් වී තිබිය යුතු ය. එදිනට පසු ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඇ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

12. අපේක්‍ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

14. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය.

2014 ඔක්තෝබර් මස 02 වැනි දින,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා යි.)

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (රජයේ චිත්‍රපට අංශය) තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම**

1.0 *මාධ්‍යය* :

සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

2.0 *පෞද්ගලික තොරතුරු* :

2.1 මුල් අකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
*උදාහරණ* : SILVA, A. B.
2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.4 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.5 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.6 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1
විවාහක - 2
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.7 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

2.8 ජාතික හැඳුනුම්පත් අංකය :

2.9 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

2.10 දුරකථන අංකය (තිබේ නම්) :

3.0 *අධ්‍යාපන සුදුසුකම්* :

| *විශ්ව විද්‍යාලයය* | *ලබා ඇති උපාධිය* | *උපාධිය වලංගු වන දිනය* | *විෂයයන්* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

4.0 *වෘත්තීය සුදුසුකම්* :————.

5.0 *පළපුරුද්ද* :————.

6.0 *අයදුම්කරුගේ සහතිකය* :

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-1167

---

**කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ඉංග්‍රීසි ලඝුලේඛක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2014**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලඝුලේඛක III පන්තියේ ඉංග්‍රීසි මාධ්‍ය තනතුරක පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පවත්වනු ලබන ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

03. *තනතුරට අදාළ වැටුප් ක්‍රමය.—*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) අනුව MN-1-2006 (A) රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 වේ.

හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

04. සේවා කොන්දේසි.—

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

4.2 2007.05.08 දිනැති 7/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාවයක් ලබා ගත යුතු ය.
4.3 කොළඹ 05, නාරාහේන්පිට පිහිටි කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ සේවය කළ යුතුය.

05. *සුදුසුකම්*

5.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

5.2 ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුය.

5.3 විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

5.4 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.5 *අධ්‍යාපන සුදුසුකම්*

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙක (02) කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම; සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

5.6 *වෘත්තීය සුදුසුකම්*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝුලේඛනය පිළිබඳ මාස හය (06) කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී යතුරු ලියනය හා ලඝුලේඛනය විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

සටහන :- ලඝුලේඛනය හා යතුරු ලියනය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතන පහත දැක්වේ.

* කාර්මික හා අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල,
* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන,
* ජාතික තරුණ සේවා සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන,
* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන.

5.7 *පළපුරුද්ද*

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ මාස හය (06) ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

06. *විභාග පරිපාටිය*

මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයකින් සමන්විතය. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන අතර එම ප්‍රශ්න පත්‍රයෙන් 40% ට වඩා ලකුණු ලබා ගන්නා ලද අපේක්ෂකයන් වෘත්තීය පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**ලිඛිත විභාගය**

| *ප්‍රශ්න පත්‍රය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|
| සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය (ඉංග්‍රීසි) | 100 | පැය 02 |

**වෘත්තීය පරීක්ෂණය**

| *විෂය* | *ලකුණු* |
|---|---|
| ලඝුලේඛනය හා පරිඝණක යතුරු | 100 |

ලිපිනය (ඉංග්‍රීසි) (ප්‍රායෝගික)

(i) *සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය (ඉංග්‍රීසි)*

දේශීය හා ජාත්‍යන්තර ක්ෂේත්‍රවල කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම, කාලීන වැදගත්කමකින් යුත් දෙන ලද මාතෘකා අතරින් තෝරාගත් මාතෘකාවක් යටතේ රචනයක් ලිවීම. (සුවිශේෂී අදහස් ඉදිරිපත් කිරීම, භාෂා කුසලතාවය, නිවැරදි ව්‍යාකරණය හා අක්ෂර වින්‍යාසය කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

(ii) *ඉංග්‍රීසි ලඝුලේඛනය හා පරිගණක යතුරු ලියනය (ඉංග්‍රීසි) (ප්‍රායෝගික)*

මිනිත්තු 5 ක් තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 80 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 7 ක වේගයෙන් පරිඝණක යතුරු ලියනය කිරීම.

07. *බඳවා ගැනීමේ ක්‍රමය*

මෙම විභාගය තරග විභාගයක් බැවින් පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% බැගින්වත් අපේක්ෂකයන් විසින් ලබා ගත යුතුය. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් මුළු ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.)

08. *විභාග ගාස්තු*

මෙම විභාගය සඳහා ගාස්තුව රු. 350 කි. විභාග ගාස්තුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය නමින් ඇති නුගේගොඩ ලංකා බැංකු ශාඛාවේ අංක 0071451995 දරන ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. අයදුම්පත් පිළියෙල කිරීම

9.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව A4 ප්‍රමාණයේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින්,

(අ) අංක 1 සිට 3 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටු වලටද වන ලෙස සකස් කල යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය.

(ආ) නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම් පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු වේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.2 මෙම විභාගය 2014 නොවැම්බර් මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

9.3 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින් එම නිවේදනයට අනුකූලව සකසා ඇති නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

9.4 අයදුම්පත් එවිය යුතු ආකාරය

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2014.11.21 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, අංක 267, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ "කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ඉංග්‍රීසි ලඝුලේඛක තනතුර සඳහා බඳවාගැනීමේ තරග විභාගය - 2014" යන්න සඳහන් කළ යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

9.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 240,360 ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්

ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම් ලැබීමෙන් පසුව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

10. විභාගයට පෙනී සිටීම

විගාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශපත්‍ර ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ඇත. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ මුදල් ගෙවූ කුවිතාන්සියේ සහ ලියාපදිංචි කළ කුවිතාන්සියේ සහතික කල ඡායා පිටපතක්ද සමග ඔබගේ විමසීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත දන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

11. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

13. මෙම විභාගය පැවැත්වීම, පත්වීම් ලබාදීම හා අනෙකුත් සියළුම කරුණු පිළිබඳ අවසන් තීරණය කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් සතු වන්නේය.

සටහන :

මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පළවී ඇති නිවේදන වල කිසියම් පරස්පර විරෝධී බවක් ඇත්නම් නිවැරදි ලෙස සලකන්නේ සිංහල භාෂාවෙන් පළ කර ඇති නිවේදනය බව කරුණාවෙන් සලකන්න.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්.

කම්කරු හා කම්කරු සබඳතා අමත්‍යාංශය,
දෙවන මහල,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට, කොළඹ 05.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ඉංග්‍රීසි ලඝුලේඛක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2014
The Open Competitive Examination for the Recruitment to the Post of Stenographer (English) in the Ministry of Labour and Labour Relations - 2014

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : PERERA A. B. C. )

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

2.4 දුරකථන අංකය :————.

3.0 3.1 විවාහක/අවිවාහක බව ෘ

විවාහක - 1 අවිවාහක - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය ෘ වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස ෘ

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන්ද? :————.

4.0 අධ්‍යාපන සුදුසුකම් ෘ

4.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය ෘ
(i) විභාගයේ වර්ෂය හා මාසය ෘ
වර්ෂය :————. මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිපල :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය ෘ
(i) විභාගයේ වර්ෂය හා මාසය ෘ
වර්ෂය :————. මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිපල :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 වෘත්තීය සුදුසුකම් ෘ

| පාඨමාලාවේ නම | කාල සීමාව | ආයතනය |
|---|---|---|
| | | |

6.0 ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

එසේ දඬුවම් ලැබ ඇත්නම් ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත්ද යන තොරතුරු සපයන්න. :————.

7.0 විභාග ගාස්තුව ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාවේ නම :————.
(ii) කුවිතාන්සි අංකය හා දිනය ෘ අංකය :————. දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

8.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට අනුකූලව ක්‍රියාකිරීමටත් මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

(ඇ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ෘ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ......... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිලමුද්‍රාව.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

10-1178

---

ඇමුණුම (01)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1,880 දරන 2014.09.12 දිනැති ගැසට් නිවේදනයේ පළ වූ "රජයේ පාසල්වල පවතින බටහිර සංගීත විෂයය ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයට බටහිර සංගීත ගුරුවරුන් බඳවා ගැනීම - 2014" මැයෙන් පල කරන ලද නිවේදනයේ 1.2.1 වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1.2.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද බටහිර සංගීතය විෂයය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

ඒ අනුව ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනය 2014.11.15 දක්වා දීර්ඝ කරනු ලැබේ.

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

10-1180

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයෙහි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය**

1.0 මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*1.1 බඳවා ගැනීමට අපේක්‍ෂිත තනතුරු :*

වගුව - අංක 01 බඳවා ගැනීමට අපේක්‍ෂිත තනතුරු

| *අනු. අංකය* | *තනතුරු නාමය* | | *පිරවීමට තිබෙන පුරප්පාඩු ගණන* | *බඳවා ගන්නා ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි පරිපාලක | කොළඹ ප්‍රධාන කාර්යාලයේ පමණක් පවතින තනතුරු වේ. මුළු සේවා කාලය තුළම ප්‍රධාන කාර්යාලයේ සේවය කළයුතු වේ. | 01 | III ශ්‍රේණිය |
| 02 | ප්‍රවාහන නිලධාරී | | 01 | III ශ්‍රේණිය |

1..2 තනතුරුවල රාජකාරි ස්වභාවය :

වගුව - අංක 02 තනතුරු වල රාජකාරි ස්වභාවය

| *අනු. අංකය* | *තනතුර නාමය* | *රාජකාරී ස්වභාවය/ප්‍රධාන කාර්යයන්* |
|---|---|---|
| 1. | ගොඩනැගිලි පරිපාලක | ● වාර්ෂික ගොඩනැගිලි නඩත්තු සැලැස්ම සකස් කිරීම<br>● ගොඩනැගිලි නඩත්තු ක්‍රියාවලිය කළමනාකරණයට යෝජනා කිරීම<br>● සේවක කණ්ඩායම් සුපරීක්‍ෂාව<br>● නඩත්තුවලට අවශ්‍ය අමුද්‍රව්‍ය, උපකරණ ගබඩා කිරීම හා කළමනාකරණය<br>● ගෙවීම් කටයුතු සඳහා මිනුම් ගැනීම සහ නිර්දේශ ලබා ගැනීම |
| 2. | ප්‍රවාහන නිලධාරී | ● දෙපාර්තමේන්තුව සතු වාහන ධාවනයට සුදුසු තත්වයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්‍ෂණික තොරතුරු සපයාදීම.<br>● අළුත්වැඩියාවන්ට අවශ්‍ය නිර්දේශ හා කාර්මික වාර්තා ලබා දීම<br>● අළුත්වැඩියාවලින් පසු වාහනවල ධාවන තත්වය පරීක්‍ෂා කිරීම, වාහන නඩත්තුව පිළිබඳ පරීක්‍ෂා කිරීම<br>● රියදුරන්ට උපදෙස් දීම<br>● රිය අනතුරුවලදී වහා පරීක්‍ෂා කර බලා වාර්තා ලබාදීම සහ අබලන් වාහන ගර්හිත කිරීම ආදී කටයුතු<br>● පරිසර හිතකාමී සහතික ලබා ගැනීම සඳහා වාහන සැකසීම |

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප :*

වගුව - අංක 03

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| III ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - - 11 x 320 - 20 x 360 - රු. 27,885 (එම්එන්3 - 2006ඒ) | රු. 15,005 |
| II ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - - 11 x 320 - 20 x 360 - රු. 27,885 (12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ) (එම්එන්3 - 2006ඒ) | රු. 17,485 |
| I ශ්‍රේණිය | මාසිකව රු. 15,005 - 4 x 180 - 6 x 240 - - 11 x 320 - 20 x 360 - රු. 27,885 (23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ) (එම්එන්3 - 2006ඒ) | රු. 21,045 |

4.0 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, මෙම තනතුරු කොළඹ ප්‍රධාන කාර්යාලයේ පවතින තනතුරු වන බැවින් මුළු සේවා කාලය තුළම ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතුය. මෙම ගැසට් නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම් වලට ආදල වන පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

5.0 *සුදුසුකම් :*

5.1 *මූලික සුදුසුකම් :*

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය,

(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ, (දැනටමත් රජයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

5.2 *අධ්‍යාපන සුදුසුකම් :-*

(*අ*) භාෂාව හෝ සාහිත්‍යය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයන් හයකින් (06) අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම;

*සහ*

(*ආ*) සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හා රසායන විද්‍යාව යන විෂයන් අතරින් විෂයන් දෙකක් (02) සහිතව විද්‍යා විෂයන් තුනකින් (03) අ. පො. ස. (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

* ගොඩනැගිලි පරිපාලක හා ප්‍රවාහන නිලධාරී තනතුරු සඳහා ඉල්ලුම් කරන්නන් ඉහත 5.1 හා 5.2 සුදුසුකම්වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් ද ලබා තිබිය යුතුය.

(1) ගොඩනැගිලි පරිපාලක

(i) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (සිවිල්) තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව ලබා තිබීම,

(ii) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 හෝ 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(2) ප්‍රවාහන නිලධාරී

(i) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (යාන්ත්‍රික) තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව ලබා තිබීම,

(ii) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 5 හෝ 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

ඉහත (1) හා (2) හි සඳහන් වෘත්තීය සුදුසුකම්, ප්‍රවාහන නිලධාරී තනතුර සඳහා යාන්ත්‍රික ක්ෂේත්‍රයෙන් ද ගොඩනැගිලි පරිපාලක තනතුර සඳහා සිවිල් ක්ෂේත්‍රයෙන් ද පහත සඳහන් ආයතනයකින් ලබා තිබිය යුතුය.

(*අ*) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(ආ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

*හෝ*

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

*හෝ*

(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

(ඉ) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම

*හෝ*

(ඊ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.3 *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

සටහන.— සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

6.0 *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගය සඳහා ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැතිබව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

7.0 *විභාග පරිපාටිය :*

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශතය* | *කාලය* |
|---|---|---|---|
| (i) බුද්ධි පරීක්ෂණය | 100 | 50% | පැය 01 |
| (ii) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | 100 | 50% | පැය 02 |

7.1 විෂය නිර්දේශය :

(i) බුද්ධි පරීක්ෂණය : අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණ කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

(ii) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :
ගණිතය :

වීජ ගණිතය (අසමානතා, විචල්‍ය, ශ්‍රේණි, ලඝුගණක)
ත්‍රිකෝණමිතිය (සමීකරණ, ත්‍රිකෝණ, විසඳීම)
සංඛ්‍යානය (මධ්‍යන්‍යය, මාතය, සම්මත අපගමනය, සම්භාවිතාව)

භෞතික විද්‍යාව :

ආලෝකය හා ප්‍රකාශ විද්‍යාව (පරාවර්තනය සහ වර්තනය : දර්පන වක්‍ර පෘෂ්ඨ, ප්‍රිස්ම කාච ප්‍රකාශ විද්‍යාවේ සූත්‍ර, අන්වීක්ෂය සහ දුරේක්ෂය) නිව්ටන් යාන්ත්‍ර විද්‍යාව (අදිශ සහ දෛශික, චලිතය පිළිබඳ නිව්ටන් නියම, ගම්‍යතාවය)

විවිධ මාතෘකා :
භූගෝල විද්‍යාව හැඳින්වීම (පෘථිවියේ හැඩය, භූ ලක්‍ෂණ ආදිය)
ඝණ වස්තුවල කෝණික දෘෂ්ඨීය සහ ප්‍රක්ෂේපණ ව්‍යුත්පන්න කිරීම.
මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරනු ලබන සිතියම්.

8.0 *තේරීම් පරිපාටිය :*

8.1 මැනුම්පති විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්‍ෂණයක ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින්, පිරවීමට අපේක්‍ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, පළමුව ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල සහ දෙවනුව තනතුර සඳහා පල කරන ලද මනාපය යන කරුණු දෙක අනුව බඳවා ගනු ලැබේ.

8.2 සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වනු ලබන අතර, සම්මුඛ පරීක්‍ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

9.0 *බඳවා ගැනීම :*

පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරා ගනු ලබන්නන් දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මගින් පවත්වන දෙවසරක, තාක්‍ෂණ ශිල්පී ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කල පසු තාක්‍ෂණ සේවයේ III ශ්‍රේණියට පත් කෙරේ.

10.0 *අයදුම්පත්‍ර සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

(අ) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ. මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කරගත යුතුය. අංක 01 සිට 04 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 04.1 - 10.1 දක්වා ශීර්ෂ 02 පිටුවේ ද, අංක 10.2 - 11.1 දක්වා ශීර්ෂ 03 පිටුවේ ද, අංක 12 - 14 දක්වා ශීර්ෂ 04 පිටුවේ ද, අංක 15 ශීර්ෂ 05 පිටුවේ ද ඇතුලත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

(ආ) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වුවත් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කල යුතුවේ.

(ඇ) ඉල්ලුම්පත් සකස් කල යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

(ඈ) නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ඉ) ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

සැ. යු. : විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කල විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.1 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා 2013.10.31 දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියළු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට මැනුම්පති විසින් ඉඩදෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිලිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්‍ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්‍ෂකත්වය අවලංගු කරනු ලැබේ.

10.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ "තාක්‍ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කල යුතුය.

10.3 අයදුම්පත්‍රයේ අපේක්‍ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කල තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

11.0 *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 800 කි. මෙම මුදල කොළඹ 05, කිරුල පාර, අංක 150 ස්ථානයේ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සරප් අංශයට හෝ ඕනෑම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයකට හෝ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය-දියතලාව වෙත ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පතෙහි ඒ සඳහා වෙන්කර ඇති ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇනවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ. රිසිට්පත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 *අයදුම් පත්‍ර යොමු කිරීම :*

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2014 නොවැම්බර් මස 27 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මැනුම්පති,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 506,
කොළඹ.

13.0 *විභාගයට පෙනී සිටීම :*
විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතුය.

14.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :

විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) තැපැල්පති විසින් නිකුත් කර ඇති වලංගු හැඳුනුම්පත,
(iii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව මැනුම්පති විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී. එම්. පී. උදයකාන්ත,
මැනුම්පති.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*ආදර්ශ අයදුම් පත්‍රය*

*මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය*

[ ]

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

01. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය :

කොළඹ [ ]

දියතලාව [ ]

අනුරාධපුරය [ ]

* විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මධ්‍යස්ථානයේ නම සඳහන් කොටුව තුළ ✓ සලකුණ ද අනෙක් කොටු දෙක තුළ x සලකුණද යොදන්න.

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E )
(දෙන ලද කොටු තුළ සංකේතය/අංකය යොදන්න.)

03. බඳවා ගැනෙන තනතුරු අතරින් පත්වීම ලැබීම සඳහා මනාප අනුපිළිවෙල :

වැඩිම මනාපය සහිත තනතුර සඳහා අංක 01 ද මනාපය අඩුවන අනුපිළිවෙල අනුව අනෙක් තනතුර සඳහා 02 ද ලෙස අනුපිළිවෙලින් මනාප අංකය සටහන් කරන්න.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *මනාප අංකය* |
|---|---|---|
| 1 | ගොඩනැගිලි පරිපාලක | [ ] |
| 2 | ප්‍රවාහන නිලධාරී | [ ] |

04. මුල්'කුරු සමග නම :————. (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

04.1 මුල්'කුරු වලින් හැඳින්වෙන නම් (පැහැදිලි අකුරෙන්) :
සිංහලෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. උපන් දිනය :

වර්ෂය :————. මාසය :————. දිනය :————.

06.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

වර්ෂ :————. මාස :————. දින :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - M ස්ත්‍රී - F) ☐

08. ස්ථිර ලිපිනය (පැහැදිලි අකුරෙන්) :————.

08.1 ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය : (උපලේඛනය 1 බලන්න)

දිස්ත්‍රික් අංකය : ☐ දිස්ත්‍රික්කයේ නම : ☐

08.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිට ද? :————.

09. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

10.1 අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර :

පළමුවර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :

වගුව - අංක 01 -

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

* ලබා ඇති ඉහලම ශ්‍රේණියේ සිට ශ්‍රේණි අනුපිළිවෙලින් විෂයන් සඳහන් කරන්න.

10.2 අ. පො. ස. (සා. පෙ.) විභාගය පිළිබඳ විස්තර :

දෙවනවර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :————.

වගුව - අංක 02 -

| විෂයය* | ශ්‍රේණිය | විෂයය* | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

* ලබා ඇති ඉහලම ශ්‍රේණියේ සිට ශ්‍රේණි අනුපිළිවෙලින් විෂයන් සඳහන් කරන්න.

10.3 අ. පො. ස. (උ.පෙ.) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) සමත් වූ විෂයයන් :————.

වගුව - අංක 03

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :

ඔව් : ☐ නැත : ☐

11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

'(ඇ) රු. ......ක් ගෙවා ලබාගත් ලදුපත අදාල ස්ථානයේ අලවා ඇත.

(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මැනුම්පති විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ……………… නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය …… දින මා ඉදිරිපිටදී ඉහත 13 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
සහතික කරන්නාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

15.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ-
වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.
කිසිඳු විනය දඬුවමකට ලක්ව නැත/ඇත.

15.2 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය/නොහැකිය. අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නිල මුද්‍රාව.

දිනය :————.

## උපලේඛනය I

ආදර්ශ අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 08.1හි සඳහන් ලිපිනය අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය සඳහා මෙම ලේඛනය අදාළ වේ.

| *නගරය/දිස්ත්‍රික්ක නාම* | *නගර/දිස්ත්‍රික්ක අංකය* |
|---|---|
| 1. කොළඹ | 01 |
| 2. ගම්පහ | 02 |
| 3. කළුතර | 03 |
| 4. මහනුවර | 04 |
| 5. මාතලේ | 05 |
| 6. නුවරඑළිය | 06 |
| 7. ගාල්ල | 07 |
| 8. මාතර | 08 |
| 9. හම්බන්තොට | 09 |
| 10. කුරුණෑගල | 10 |
| 11. පුත්තලම | 11 |
| 12. අනුරාධපුර | 12 |
| 13. පොළොන්නරුව | 13 |
| 14. බදුල්ල | 14 |
| 15. මොණරාගල | 15 |
| 16. රත්නපුර | 16 |
| 17. කෑගල්ල | 17 |
| 18. අම්පාර | 18 |
| 19. මඩකළපුව | 19 |
| 20. ත්‍රිකුණාමලය | 20 |
| 21. යාපනය | 21 |
| 22. වවුනියාව | 22 |

10-961

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

### ආදර්ශ අයදුම්පත් කැඳවීමේ නිවේදනය - විවෘත

දිවයින පුරා පිහිටි රාජ්‍ය ආයතනවල ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ සිවිල්, යාන්ත්‍රික, විදුලි (බැර හා ලුහු) සහ රසායන ඉංජිනේරු කාණ්ඩවලට අයත් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ "විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2014" යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2014.12.01 දින වේ.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ද ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. සේවයට බඳවාගැනීමේ ක්‍රමය :

1.1 විවෘත බඳවාගැනීම සඳහා අදාළ විෂය ධාරාවන් යටතේ වෘත්තීය සුදුසුකම් ලත් ඉංජිනේරුවන් පමණක් බඳවා ගනු ලැබේ. පත්වීම් දීම සඳහා තෝරා ගනු ලබන්නේ අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයකට කැඳවා තනතුර සඳහා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුවය. පත්වීම් ක්‍රියාත්මක වන දිනය සහ පත්කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

2.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1836/6 දරන හා 2013 නොවැම්බර් මස 11 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, එම ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදුකර ඇත්තා වූද මින් මතු සිදුකරනු ලැබිය හැකි වූද සංශෝධනවලට ද, රාජ්‍ය සේවයේ පත්කිරීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

2.2. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

2.3 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර 05 ක් තුළදී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් වසර 03 ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීනතාවය ලබාගත යුතු අතර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාව වසර හයක් (06) ඇතුලත ලබාගත යුතුය. 1 කණ්ඩයට අයත් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම ලබා ගත යුතුය.

2.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසිවලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත්වේ.

2.6 පත්වීම්ලාභීන්, දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා වාර්තා කළ යුතු ය.

2.7 පත්වීම් ලාභීන් රාජ්‍ය සේවයේ මෙන්ම පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් වේ.

2.8 තමන් පත්කරනු ලබන තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින පත්වීම්ලාභීන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ඉඩ ඇත.

3. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006, රු. 22,935- 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 ක (මාසික) වැටුප් පරිමාණය හිමි වේ.

කෙසේ වෙතත් බඳවා ගනු ලබන අවස්ථාවේදී පූර්ණ වෘත්තීය සුදුසුකම් (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා තිබෙන හෝ බඳවා ගැනීමෙන් පසු ඉංජිනේරුවරයකු පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබාගත් විට එම නිලධාරියා සේවයේ III ශ්‍රේණියේ හයවන (06) වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ.

4. *අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් :*

4.1 අධ්‍යාපන සුදුසුකම් :

4.1.1 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක එම කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති වසර 04 ක පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධි පාඨමාලාවකට බඳවාගනු ලබන විෂය ධාරාවක් යටතේ සාර්ථකව සම්පූර්ණ කර උපාධිය ලබා තිබිය යුතුය;

නැතහොත්

4.1.2 ඉහත 4.1.1 හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන සහ අනිකුත් සියලු අවශ්‍යතා බඳවා ගනු ලබන විෂය ධාරාවක් යටතේ සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතිකය ලබා තිබිය යුතුය.

4.2 වෘත්තීය සුදුසුකම් :

4.2.1 ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් අධ්‍යයන අවශ්‍යතා සම්පූර්ණ කර එහි ආශ්‍රිත සාමාජිකත්වය ලබාගැනීමට සුදුසුකම් සපුරා තිබෙන බව සනාථ කිරීමට එම ආයතනය විසින් නිකුත් කරනු ලබන වලංගු සහතිකය ලබා තිබිය යුතුය.

5. *වයස් සීමාව :*

5.1 අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි වීම.

5.2 කෙසේ වෙතත් 2013.11.11 දිනට පෙර සේවයට බැඳී ඇති රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ කාර්මික නිලධාරියකුට (එනම් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් ඉංජිනේරු සහකාරවරයෙකු (කලින් කාර්මික සහකාර) හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක් දරන නිලධාරියෙකු හෝ අනෙකුත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරනු ලබන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් පත්වීම් බලධාරියා විසින් අනුමත කරනු ලැබූ සුදුසුකම් ලත් කාර්මික නිලධාරියෙකුට) උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ.

6. *කායික සුදුසුකම් :*

6.1 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

7. *වෙනත් සුදුසුකම් :*

7.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

7.2 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

7.3 ඉහත 4 යටතේ දැක්වෙන සුදුසුකම්වලට අදාළ සහතික නිකුත් කිරීමට පාදක කරගනු ලබන සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛනවල (Academic transcript) අඩංගු විෂයන්, බඳවා ගනු ලබන සේවා කාණ්ඩවල අවශ්‍යතාවලට සෑම අතින් ම අනුකූල විය යුතුය.

7.4 යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු අයදුම්කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

7.5 ඉහත අංක 5.2 යටතේ සුදුසුකම් ලබන කාර්මික නිලධාරියෙකු තම සේවයේ ස්ථිර වී අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනවනවිට එම සේවයේ පූර්වාසන්න වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

7.6 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සහ කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. *ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණය* :-

8.1 ලිඛිත විභාගය :

8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

8.1.2 ඉහත 4 හි සුදුසුකම් සපුරා ඇති ඉංජිනේරුවන්ගේ බඳවා ගැනීමේ අනුපිළිවෙල නිශ්චය කර ගැනීමේ අරමුණින් මෙම ශ්‍රේණිගත විභාගය පවත්වනු ලැබේ.

8.1.3 විෂය නිර්දේශය :
ඉහත 4 හි සඳහන් ඉංජිනේරු විද්‍යාව හැදෑරීම තුළින් ලබා ගත් දැනුම මත අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වය, විශ්ලේෂණ හැකියාව හා තීරණ ගැනීමේ හැකියාව විනිශ්චය කිරීම අරමුණු කරගෙන මෙම විභාගය ලකුණු 100 කින් සමන්විත ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට සීමා කරනු ලැබේ. විභාග ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වන අතර ඒ සඳහා පැය 1 1/2 ක කාලයක් ලබා දේ. ප්‍රශ්න සිල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

8.2 *සම්මුඛ පරීක්ෂණය* :

8.2.1 අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

8.2.2 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරයි.

8.2.3 මෙහිදී ලකුණු ලබාදෙනු නොලැබේ.

8.2.4 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂාව සිදු කරනු ලබයි.

8.2.5 අපේක්ෂකයෙකු විසින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අදාළ සහතික හා ලේඛන ඉදිරිපත් කළ යුතු අතර එම සියලු ලේඛන/සහතික සෑම අතින් ම වලංගු ඒවා විය යුතුයි. නිසි බලධාරියාගේ ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කරනු ලබන කිසිදු ලේඛනයක්/සහතිකයක් වලංගු නොවේ.

8.2.6 අපේක්ෂකයන් කීප දෙනෙකු සමාන ලකුණු ලබා ඇත්නම් එවැනි අවස්ථාවල සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

9. *විභාග කොන්දේසි* :-

9.1 විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

9.2 විභාග ගාස්තුව රු. 1000.00 කි. විභාග ගාස්තුව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ප්‍රථම ඕනෑම දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.3 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

9.4 විභාගය කොළඹදී පවත්වනු ලබන අතර විභාග දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

9.5 අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන.*—ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

9.6 අයදුම්පත්‍රය A4 කඩදාසිවල දෙපැත්තම යොදාගනිමින් සකස් කළයුතු අතර, අංක 1.0 සිට 5.0 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද 6.0 සිට 7.0 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, 8.0 සිට 11.0 තෙක් ශීර්ෂ තුන්වන පිටුවට ද , ශීර්ෂ අංක 12 හතරවැනි පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවටත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදිය යුතුය. එසේම නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍ර යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතුය. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

9.7 ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්පත් වල නිවේදනයක් පළකරනු ලැබේ. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව

සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කර වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින 05 කටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

9.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල්දැමීමේ හා අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

9.9 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

9.10 අපේක්ෂකයාගේ අනන්‍යතාවය : විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සැලකිය යුතුය :*

(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවෙකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.2,40,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙක් හෝ ලවා සහතික කරවා ගත යුතුය.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා විධායක සේවා ගණයේ III ශ්‍රේණියට අදාළ වූ සේවා ව්‍යවස්ථාව හා ඊට සිදුකර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

11. ලිඛිත විභාගයෙන් ලබාගත් ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු, විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත යැවීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

12. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2014 ...... මස ...... වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වැනි ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

Open Competitive Examination for Recruitment Engineers to the Grade III of the Sri Lanka Engineering Service - 2014

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

| | |
|---|---|
| සිංහල | 2 |
| දෙමළ | 3 |
| ඉංග්‍රීසි | 4 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්කරන කාණ්ඩය :

| | |
|---|---|
| සිවිල් | 1 |
| යාන්ත්‍රික | 2 |
| විදුලි (බැර හා ලුහු) | 3 |
| රසායන | 4 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 නම :-

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————. Mr/Mrs/Miss.
උදා : Mr. GUNAWARDHANA, M. G. B. S. K.

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(ජාතික හැඳුනුම්පතෙහි සඳහන් භාෂාවෙන්)

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 විභාග ප්‍රවේශ පත්‍ර යොමු කළ යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.3 දුරකතන අංක : ස්ථාවර :————.
ජංගම :————.

2.4 තැපැල් නගරය :————.

2.5 විද්‍යුත් තැපැල :————.

3.0 ස්ත්‍රී/පුරුෂ බව : ☐ (ආදල අංකය කොටුව තුළ ලියන්න)
(පුරුෂ 0 ස්ත්‍රී - 1)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

5.0 5.1 ජන වර්ගය : ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(සිංහල - 1/දෙමළ - 2 ඉ. දෙමළ - 3/මුස්ලිම්-4/වෙනත් -5)

5.2 විවාහක/අවිවාහක බව : ☐
(අවිවාහක - 1, විවාහක - 2)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.3 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

5.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

6.0 6.1 *අධ්‍යාපන සුදුසුකම් :*

(i) උපාධිය හෝ *ගැසට් නිවේදනයේ* 4.1.2 ඡේදයේ සඳහන් සුදුසුකම් බල පැවැත්වෙන දිනය;
(ii) විශ්ව විද්‍යාලය/ආයතනය;
(iii) ලියාපදිංචි වූ අංකය සහ දිනය;
(iv) පාඨමාලාවේ නම : (උදා : විද්‍යාවේදී ඉංජිනේරු, BSc Engineering);
(v) විෂය ධාරාව : (උදා : සිවිල්, යාන්ත්‍රික, නිෂ්පාදන, විදුලි, ඉලෙක්ට්‍රොනික, රසායනික);
(vi) උපාධිය හෝ *ගැසට් නිවේදනයේ* 4.1.2 ඡේදයේ සඳහන් සුදුසුකම හෝ සම්පූර්ණ කළ වසර;
(vii) අවසාන වසරේ විෂයන්;
(viii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය;

6.2 වෘත්තීය සුදුසුකම් : (ලබා ඇත්නම්) (උදා : MICE, MIE) :————.

7.0 දැනට දරන තනතුර සහ පෙර දරන ලද තනතුරු ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

(සේවයට බැඳුනු දිනය හා ඉවත් වූ දිනයන් ද, එසේ ඉවත් වීමට හේතුන් ද සඳහන් කළ යුතුය.)

7.1 තනතුර :————.
7.2 දෙපාර්තමේන්තුව/ආයතනය :————.
7.3 පත්වීම් දිනය :————.
7.4 ස්ථිර/විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත/තාවකාලික ද යන වග :————.
7.5 තනතුර ස්ථිර කර තිබේද යන වග :————.
7.6 තනතුරේ වැටුප් පරිමාණය සහ දැනට ලබන වැටුප :————.
7.7 පෙර දරන ලද තනතුරු පිළිබඳ විස්තර : (අමතර කොළයක් භාවිත කළ හැකිය) :————.
7.8 මෙහි සඳහන් කවර හෝ තනතුරක් දරන අතර ඔබ විනය දඬුවමකට භාජනය වී ඇති ද? එසේ නම් එම වරද සහ ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

8.0 යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී ඇත්ද? එසේ නම් වරද සහ ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

9.0 මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ එහි එක් දාරයකින් මනා ලෙස අලවන්න. (කුවිතාන්සියේ ඡායා පිටපතක් තමන් වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත).

කුවිතාන්සි අංකය :————.
ගෙවන ලද කාර්යාලය :————.
දිනය :————.

10.0 *අයදුම්කරුගේ සහතිකය :*

මෙම අයදුම්පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මම මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුනහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත් කර ගැනීමෙන් පසුව එම වරද දැනගන්නට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් බව දනිමි.

තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. (*ගැසට් නිවේදනයේ* 9.10 පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන...………….... (සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, මුදල්

කුවිතාන්සිය අලවා ඇති බවත්............. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

________,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :————.
අත්සන සහතික රකන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි.)

12.0 අයදුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරන...........  (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්...........  දින ඔහුගේ/ඇයගේ ආදර්ශ අත්සන මා ඉදිරියේ තැබූ බවත් සහතික කරමි.

ඉහත 07 වැනි ඡේදයේ නිලධාරියාගේ වර්තමාන සේවය පිළිබඳව දී ඇති විස්තර නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම.......... . බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුයි)

10-1113

---

## සෞඛ්‍ය අමාත්‍යාංශය

### වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2014 වර්ෂය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ පහත සඳහන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවන් සඳහා ජාතික විශ්වවිද්‍යාල මඟින් උපාධිය ලබාගත් උපාධිධාරීන් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. එක් එක් පුහුණු පාඨමාලාවන්ට අදාළව පහතින් දක්වා ඇති උපාධිය සම්පූර්ණ කළ වර්ෂය (උපාධිය ක්‍රියාත්මක වන දිනය) පදනම් කරගෙන කුසලතා ලේඛන සකස් කර එක් එක් පුහුණු පාඨමාලාවන්ට සුදුස්සන් තෝරා ගනු ලැබේ. බඳවා ගන්නා දිනය වන විට එක් එක් තනතුරුවල පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව බඳවා ගත හැකි උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද යන්න අනුමත බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන අනුව තීරණය කරනු ලැබේ. බඳවා ගනු ලබන පුරප්පාඩු ප්‍රමාණයට වඩා උපාධිධාරීන් ඉල්ලුම් කර ඇත්නම් පුහුණුවට තෝරා ගැනීම සඳහා සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය පිළිබඳ පැය 01ක ප්‍රශ්න පත්‍රයකින් යුත් ලිඛිත තරග විභාගයක් පවත්වනු ලැබේ. එවැනි අවස්ථාවකදී එම විභාගයේ කුසලතා අනුපිළිවෙල අනුව කුසලතා ලේඛනයක් සකස්කර එක් එක් පුහුණු පාඨමාලාවන්ට සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2. *තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් ඃ-*

| *සංකේත අංකය* | *අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව* | *සම්පූර්ණ කළ යුතු උපාධිය* |
|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී (B.sc MLT) |
| 2 | ඖෂධවේදී | ඖෂධවේදී (B.sc Pharm)<br>විද්‍යාවේදී (ඖෂධවේදී) විශේෂ [B.sc (Pharmacy) Special |
| 3. | භෞත චිකිත්සක | භෞත චිකිත්සකවේදී (B.sc Physiotherapy) |
| 4. | විකිරණ ශිල්පී | විකිරණ ප්‍රතිකාරවේදී (B.sc Radiotheraphy)<br>විකිරණ විද්‍යාවේදී (B.sc Radiography) |

3. *අනෙකුත් පොදු සුදුසුකම් ඃ*

(*අ*) 2014.11.28 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු, වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

(*ආ*) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර දිනයක් විය යුතු ය.

(ඇ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඈ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 3 ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය.

4. *අයදුම් කළ යුතු ක්‍රමය :-*

(අ) A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කර මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර අංක 1 සිට 09 දක්වා පළමු පිටුවේ ද, 10 සිට 13 දක්වා දෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතු ය.

(ආ) අයදුම්පතේ 'ලදුපත' යන ස්ථානයේ, ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - විභාග ගාස්තු රැස්කිරීම" යන ගිණුමට රු. 300 බැර කර එම ලදුපත නොගැළවෙන සේ ඇලවිය යුතුය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබා ගන්න.)

(ඇ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු හෝ නීතිඥවරයකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 2,75,220 ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "පරිපූරක වෛද්‍ය සේවාවන්හි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් ලෙස උපාධිධාරීන් බඳවා ගැනීම - 2014" වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර "අධ්‍යක්ෂ පාලන 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2014.11.28 දිනට පෙර එවිය යුතු ය.

(ඉ) මේ වන විට කොන්ත්‍රාත් පදනම මත සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනවල සේවයේ යොදවා ඇති උපාධිධාරීන් ද ස්ථිර පත්වීමක් ලබාගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් සළකා බැලීමට හැකිවන පරිදි මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් කොන්දේසිවලට යටත්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

5. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බවත් අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිඳු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් සිහි තබාගත යුතු ය.

6. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ද දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් තෝරා ගැනීම සඳහා තරග විභාගයක් නොපවත්වයි නම් උපාධිය බලාත්මක වන දිනය මත පදනම්ව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. උපාධිය බලාත්මක වන දිනය මත තෝරා ගැනීමට අසීරු අවස්ථාවල දී ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) මත තෝරා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. බඳවා ගැනීම සඳහා තරග විභාගයක් පවත්වයි නම් එහි කුසලතා අනුපිළිවෙල අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කර සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත බැගින් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය;

(ආ) උපාධි සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතු ය);

(ඇ) අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ. පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත;

(ඈ) ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතු ය.);

(ඉ) ඉහත 3 (ඈ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය).

10. *පුහුණු කිරීමේ පරිපාටිය :-*

| *සංකේත අංකය* | *අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව* | *එම පාඨමාලාවේ කාල සීමාව* | *එම පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|
| 1. | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | මාස 06 | ඉංග්‍රීසි |
| 2. | ඖෂධවේදී | මාස 06 | ඉංග්‍රීසි |

| සංකේත අංකය | අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව | එම පාඨමාලාවේ කාල සීමාව | එම පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය |
|---|---|---|---|
| 3. | භෞත චිකිත්සක | මාස 06 | ඉංග්‍රීසි |
| 4. | විකිරණ ශිල්පී | මාස 06 | ඉංග්‍රීසි |

(i) සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාළ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට අනුයුක්ත කරනු ලැබේ. පාඨමාලාවන්, ඉහත ගැසට් නිවේදනයේ ඒ ඒ පාඨමාලාවන් ඉදිරියේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් හැදෑරිය යුතු ය.

(ii) පුහුණු පාසල් වලට ඇතුලත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාලපරිච්ඡේදය අවසානයේ දී සාර්ථකව එය නිම නොකරන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසැලෙහි පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

(iv) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රු. 12,360 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුලත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන් ම නිම කිරීමෙන් පසු අදාල තනතුරේ පත්වීම් ලද හොත් අවම වශයෙන් වර්ෂ පහක (5) කාලපරිච්ඡේදයක් අදාළ පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත් කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාල සීමාව තුළදී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැරගියහොත්, ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ පහක (05) කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අදාල තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

9. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :-*

පුහුණුව අවසානයේ අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදුකරන/නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්වය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු මත අදාළ තනතුරේ III වැනි පංතියේ තනතුරට පත්කිරීමට කටයුතු කෙරේ.

උක්ත සංකෝත අංක 1, 2, 3, 4 ලෙසින් වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාව සඳහා රාජ්‍ය පරිපාලක චක්‍රලේඛ 06/2006 (iv) රු. 15,440-5x180-5x240-11x320-20x360 - රු. 28,260 යන වැටුප් පරිමාණය හිමිවන අතර III වන ශ්‍රේණියේ පිහිටුවා ආරම්භක වැටුප් පියවරෙහි තබා වැටුප් ගෙවනු ඇත.

10. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු ඉහත සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහකරන අතර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

11. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

12. ඉහත පරිදි බඳවාගන්නා ලද සියලුම දෙනා රජයේ නිලධාරීන්ට අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

13. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් හෝ මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

14. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

සුධර්මා කරුණාරත්න,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2014 ඔක්තෝබර් මස 08 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත්‍රය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ පාඨමාලාවන් සඳහා
උපාධිධාරීන් බඳවා ගැනීම - 2014

* අයදුම් කරන පාඨමාලාව (සිංහලෙන්/දෙමළෙන්) :————.
* අයදුම් කරන පාඨමාලාව (ඉංග්‍රීසියෙන්) :————.

| පුහුණු පාඨමාලාවට අදාළ සංකේත අංකය (ගැසට් නිවේදනයට අනුව) |
|---|
| |

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා :* A. B. C. SILVA

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්
.................................... ....................................
.................................... ....................................
.................................... ....................................
.................................... ....................................

4. (අ) ස්ථිර ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්
.................................... ....................................
.................................... ....................................
.................................... ....................................
.................................... ....................................

(ආ) දුරකථන අංක :- ජංගම : | | | | | | | | | | | ස්ථාවර : | | | | | | | | | | |

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක් ද? ඔව්/නැත :————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන් ද? :————.

5. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

2014.11.28 දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග : ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

8. විවාහක/අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

9. අධ්‍යාපන සුදුසුකම් :

| # | *සමත් වූ උපාධිය* | *සාමාර්ථය* | *ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA)* | *විශ්වවිද්‍යාලය* | *අධ්‍යයන වර්ෂය* |
|---|---|---|---|---|---|
| 1 | | | | | |

10. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? ඔව් - ☐ නැත - ☐
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න :————.

11. අයදුම්කරුගේ සහතිකය :

(අ) මා විසින් ගැසට් නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට මා යටත් බව ද දැන සිටිමි.

(ඇ) එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, මට අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, හොඳින් අවබෝධ කරගෙන සිටින බවත් ප්‍රකාශ කර සිටිමි.

ලදුපත
රු. 300

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන...................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඔහු/ඇය. ..................... දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

* සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

* තනතුර :————.

————,
සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

* ලිපිනය :————.

13. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න) :

(i) ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන ..................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ............................. තනතුර දරන බව මින් සහතික කරමි.

(ii) ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, මොහු/මැය තනතුර සඳහා තෝරාගත හොත් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

(iii) එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදාල පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

* දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.
* තනතුර :————.
* ලිපිනය :————.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව.

10-1029

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.